# ගුණදාස අමරසේකරගේ නවකතාවල ඇතුළත් ස්ත්‍රී චරිතඃ ස්ත්‍රීවාදී අධ්‍යයනයක්

නදීෂා වීරසිංහ[1]

## හැඳින්වීම

ගුණදාස අමරසේකරගේ තෝරාගත් නවකතා යුගලයක් ඇසුරින් ඔහුගේ නවකතාවල නිරූපිත ස්ත්‍රී චරිත පිළිබඳ ස්ත්‍රීවාදී අධ්‍යයනයක් වන මෙය පශ්චාත් නූතන අවධියෙහි සමාජ විපර්යාසවලට මුහුණ දීමෙන් කාන්තාවගේ භූමිකා සහ සාම්ප්‍රදායික ස්වරූපය වෙනස් වී ඇති ආකාරය විමර්ශනය කරයි. අමරසේකරගේ ගමනක මුල කතා පෙළෙහි අවසන් නවකතාව වන 2011 වර්ෂයේ දී ප්‍රකාශිත ගමනක අග නවකතාව සහ 2023 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කළ මහගෙදර නවකතාව පර්යේෂණ නියැදියයි. කාන්තාවගේ කුටුම්භ සහ සමාජීය භූමිකා කිහිපයක් දශකද්වයයක දී සමාජ තත්වය සහ වෘත්තීය තත්වය අනුව සම-අසම ලක්ෂණවලින් සමන්තවිත වී ඇත. පර්යේෂණ ගැටලුව වන්නේ, ගුණදාස අමරසේකර ස්වකීය නවකතාවල දී ස්ත්‍රී භූමිකා නිරූපණය කරන ආකාරය සමාජ වෙනස්කම් සමග තුල්‍ය වන්නේ කෙසේ ද යන්නයි. ගුණදාස අමරසේකරගේ නවකතා පිළිබඳ විමල් දිසානායකගෙa Sinhalese Novel and the Public Sphere යන කෘති අවධානයට ලක් කළ අතර ඔහුගේ මෙම නවකතා යුගලයෙහි නිරූපිත විශේෂ අවධි යුගලයෙහි ස්ත්‍රී චරිත පිළිබඳ අධ්‍යයනයක් සිදු කළ බවට තොරතුරු අනාවරණය නොවිණි. මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ කාලයත් සමග පරිණාමය වූ කාන්තා චින්තනය සමකාලීන භූමිකා සහ තත්ව කෙරෙහි සිදු කළ බලපෑම කෙබඳුද යන්න සොයා බැලීමත්, එය සමාජය කෙරෙහි සිදු කරන බලපෑම සහ කතුවරයා එය නිරූපණය කරන ආකාරය කෙබඳුද යන්න අධ්‍යයනය කිරීමත්ය. කාන්තාව සමාජයේ උපරි ව්‍යුහයට සමීප නොවූ ගෘහස්ථ භූමිකා නියෝජනය කරමින් සිට පශ්චාත් නූතන යුගයේ දී සමාජයේ සිදු වූ වෙනස්කම් සමග ගතානුගතික, සාම්ප්‍රදායික තත්වවලින් විතැන් වී ප්‍රමුඛ සමාජ කාර්යයක නිරත වීම ආරම්භ කර ඇත. අමරසේකර මෙම නවකතා යුගලයෙන් අවධානයට ලක් කරන අවධි දෙකකට අයත් කාන්තාවගේ කුටුම්භ සහ සමාජ කාර්යයභාරය, මැදිහත් වීම නූතන යුගයට වැදගත් ය. ඇය සක්‍රිය කර බුද්ධිමය සහ ප්‍රායෝගික ලෝකයේ තීරණාත්මක සාධකයක් වශයෙන් ප්‍රමුඛ කරවීමට උත්සාහ ගන්නා අවධියක ඇයගේ කාර්යභාරය සහ යුගානුරූපී ව සිදු වන සහ සිදු විය යුතු වෙනස්කම් සහ ඒවාට අවශ්‍ය පසුබිම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණදාස අමරසේකරගේ ගමනක මුල සහ මහගෙදර නවකතා පදනම් කර ගනියි. ගුණාත්මක අධ්‍යයන ක්‍රමවේදය යටතේ පුස්තකාල අධ්‍යයනය

1. තාවකාලික සහකාර කථිකාචාර්යල සිංහල අධ්‍යයනාංශයල රුහුණ විශ්වවිද්‍යාලය.
nadeeshaweerasinghe98@gmail.com

පර්යේෂණ විධික්‍රමය යි. පශ්චාත් නූතනවාදය සහ ස්ත්‍රී වාදය යන න්‍යාය යුගලය අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමුඛ වන අතර සමාජීය සාහිත්‍යය අධ්‍යයනය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී න්‍යාය ද යොදා ගැනෙයි. ස්ත්‍රියගේ කායික සහ මානසික වෙනස්වීම් කෙරෙහි බලපෑ සමාජ වෙනස්කම් අධ්‍යයනයේ දී පශ්චාත් නූතනවාදී අවධිය කේන්ද්‍ර කර ගත් දේශපාලන පසුබිමෙහි බලපෑම් ද සහිත සමාජ විවරණයක් නවකතා යුගලයෙහි ම අන්තර්ගත බැවින් එය විචාරාත්මක අධ්‍යනයට ලක් කරන්නේ නවකතා යුගලයෙන් නිරූපිත සමාජ තත්ව තුලනාත්මක ව අධ්‍යයනය කරමිනි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ගමනක මුල නවකතාවෙන් ඇරඹෙන කතා මාලාවෙහි අටවන මෙන් ම අවසන් නවකතාව වන ගමනක අග නවකතාව ලාංකේය සමාජයේ සිදු වූ සමාජ, දේශපාලන වෙනස්කම් වෙත විශේෂයෙන් අවධානයට ලක් කරමින් රචනා කළ කෘති යුගලයකි. එම යුගයෙහි අවසානය සටහන් කරන ගමනක අග නවකතාව දශක ගණනක විවරණයේ අවසානය වශයෙන් කතුවරයා දක්වයි. එහි ඇතුළත් කාන්තා චරිතවල ගතිකත්වය අවසන් නවකතාවෙහි දී උසස් කුලවත්, මධ්‍යම පාංතික තලයක තබා ඇති අතර ඇයගේ චින්තන රටාව, සමාජ අද්දැකීම් වෙත යොමු කරන අවධානය දශක දෙකකට පෙර ලාංකේය සමාජයේ කාන්තාවගේ ස්වරූපය ඉස්මතු කිරීමට උත්සාහ කර ඇත. මල්ලිකා, සුජාතා, මොරීන් සහ දීපිකා යන කාන්තා චරිත මඟින් කතුවරයා ඉස්මතු කරන කාන්තා භූමිකා කිහිපයකි. මල්ලිකා දරුවන් නොමැති විවාහක කාන්තාවක ලෙස ද, සුජාතා පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ හැදෑරූ විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකුගේ බිරිඳක ලෙස ද, දීපිකා විදෙස්ගත කුලීන පවුලක තරුණියක ලෙස ද, සුජාතාගේ ලේලිය වන මොරීන් අන්‍යාගමික මෙන් ම වෘත්තියෙන් වෛද්‍යවරියක ලෙස ද නිරූපණය කර ඇත. ගමනක අග නවකතාවෙහි ඇතුළත් මෙම භූමිකා දේශීය ව පමණක් නො ව විදේශීය වශයෙන් ද ගනුදෙනු කරයි. පවතින සමාජ-දේශපාලන තත්ව හේතුවෙන් විදේශගත වී සිටින මොවුන් කුලවත්, ධනවත් පවුල් පසුබිම් සහිත කාන්තාවන් ය. සමාජය, දේශපාලනය, ආර්ථික, විදේශ ආක්‍රමණ, ශාස්ත්‍රීය අධ්‍යයන වැනි ඔවුන්ගේ පවුල්වල පුරුෂයන්ගේ දෛනික විෂයයවලට මෙම කාන්තාවන්ගේ මැදිහත් වීමක් නොමැත. සුජාතා නිරූපණය කරන සාම්ප්‍රදායික ලාංකේය කාන්තාවගේ ලක්ෂණ අතර දැඩි ආගමික භක්තිය, කුලය-සමාජ පංතිය සහ තත්වය පිළිබඳ අසීමිත පක්ෂපාතීත්වය අවසානයේ ඇය විශාදයෙන් පෙළෙන රෝගියෙකු බවට ද පත් කරයි. සිය දරුවාගේ විවාහය සම්මතයෙන් බැහැර වූවක් යන මතයේ දැඩි ව එල්බී සිටින ඇයට සාපේක්ෂ ව මල්ලිකාගේ දෘෂ්ටිය විවෘත ය. පාරම්පරික නැන්දම්මා -ලේලි අර්බුදය මොරීන් සහ සුජාතා අතර තාවකාලිකව ඇති වූයේ වාර්ගික සහ සංස්කෘතික පරස්පරතා හේතුවෙන් පමණි. "දීපිකාගේ වලව් රස්නය" (2011: 29) ඇයගේ මවගෙන් ලැබූ ආභාසයක් වශයෙන් දක්වයි. සිරිමා තම දියණිය සහ ඇගේ අධ්‍යාපනය, නිදහස පිළිබඳ සිතන ආකාරය "අපේ මේ දුව විශ්වවිද්‍යාලෙට පාස් වෙලත් අපි ඇරියෙ නැහැ. මේ විශ්වවිද්‍යාල අපේ ගැනු දරුවෙක් අරින්න පුළුවන් තැන් නෙවෙයි..."(2011: 27) යන අදහස පංති මානසිකත්වය ඉස්මතු කිරීමට දරණ උත්සාහයක් නිරූපණය කරයි.

සමකාලීන දේශපාලන තත්ව පිළිබඳ සංවාදවලට සම්බන්ධ වීම හෝ ඒ පිළිබඳ දැනුවත් භාවය ද පුරුෂයාට පමණක් අයත් තේමාවක් වශයෙන් සලකා දෛනික

සවිඥාන ලෝකයෙන් බැහැර ව ජීවත් වීමට නැඹුරු වූ කාන්තා චරිත වශයෙන් නිරූපිත ය. සහෝදරයන්ගේ විවාහය මහගෙදරට සිදු කරන බලපෑම සහ ජාතික වශයෙන් සිදු වන පාවා දීම්, අනවබෝධය, ආත්මාර්ථකාමී අපේක්ෂා සහ බටහිර අධ්‍යාපනය ලැබූවන්ගේ චර්යා රටා ඇසුරින් සිදු කරන මහගෙදර නවකතාවේ අන්තර්ගතය මඟින් සිදු කරන්නේ ගමනක අග නවකතාවට දශක දෙකකට පමණ පසු ලාංකේය සමාජයේ සිදු වූ වෙනසයි. ලොකු අයියා, සේන සහ දාස යන පුරුෂ චරිතත්‍රය නිවසේ දරුවන් වන අතර මව, පියා, නාලිනී සහ ලොකු අයියාගේ බිරිඳ යන චරිත කතා විකාශයට දායක වෙයිග ඔවුනොවුන්ගේ චර්යා සහ නවකතාවේ විග්‍රහ වන කේන්ද්‍රීය සිදුවීම විකාශයෙහි ලා මව, නාලිනී සහ ලොකු අයියාගේ බිරිඳ යන තිදෙනාගේ බලපෑම ප්‍රමුඛ ය. "ඒ කාලකණ්ණි හැතිරි මේක විකුණලා තියෙන්නේ ලක්ෂ විස්සක් වැනි සුළු මුදලකට ලු" (මහගෙදර, 2013: 1). මහගෙදර විදේශිකයන් සතු වන්නේ ඇය මහගෙදර අලෙවි කළ හෙයිනි. මධ්‍යම පාංතික ආකල්ප හර පද්ධතියට බලපෑම් කරන අතර ඇය පිළිබඳ සහෝදරයන්ගේත්, මවගේත් සිතෙහි පවතින ආකල්පය යහපත් නොවූවකි. දාස නාලිනී විවාහ කර ගැනීම ඇයගේ සමාජ තත්වය අනුව ගැටලුවක් වුව ද දැනුම, බුද්ධිය, වෘත්තියල ඉදිරිගාමී බව සහ සමාජ සවිඥානිකත්වය වැනි ප්‍රවණතා ඇයගේ චරිතය නූතනවාදී ස්ත්‍රියක බවට පත් කර ඇත. "ඔයා එක්කත් මේ ගැන කතා කරගන්නලු" (2013:08) යන සේනකගේ ඉල්ලීම කාන්තාවගේ අවශ්‍යතාව ඇය ගොඩනගා ගත් සමාජ අවබෝධය ඇයගේ වෘත්තීය තත්වය සමඟ ගොඩනැගෙන්නක් බව සහතික කරයි. ගමනක අග නවකතාවේ කාන්තාවන්ට සාපේක්ෂව මෙහි කාන්තාවන් සක්‍රිය චරිත වශයෙන් නිරූපණය කරන්නේ පවුලෙහි සිදු වන විශේෂ සිදුවීම්, ජාතික වැදගත්කමක් ඇති සාකච්ඡා සඳහා කාන්තාවට අවකාශය ලැබෙන හෙයිනි. දාසගේ මව ද රැකියාවෙන් විශ්‍රාම ලැබූ කාන්තාවකි. පියා ද මවගේ ආධිපත්‍යයට නතු වී සිටි නිවසේ උපයන්නිය ඇය වී සිටියා ය. කථකයාගේ ජීවිතයේ මහගෙදර පිළිබඳ සුන්දරම මතක සහිත අවධිය වීමට මවගේ නායකත්ව ශක්‍යතාව හේතු විය. සමාජයේ ගැඹුරු පරිවර්තන සඳහා ගැහැණිය සංවාදයට විවෘත බව  එන්.ජී.ඕ සහ ජාතිද්‍රෝහී ව්‍යාපාරයේ නාලිනීගේ අදහස් දැක්වීමෙන් අවධාරණය කරයි. නිව්මන් සහ මාරසිංහගේ ව්‍යාපාරය සහ දාස සමඟ පවත්වන ගනුදෙනුවෙහි අවදානම් සහගත බව නාලිනීට ගෝචර වන්නේ දූරදර්ශීව යග "මට හිතෙන හැටියට නම් ඔයිට වැඩිය දෙයක් ඔතැන තියෙනවා" (අමරසේකර:13) යන නාලිනීගේ ප්‍රකාශය සමාජය පිළිබඳ ගැඹුරු අවබෝධයක් සතු පශ්චාත් නූතනවාදී ගැහැනිය නිරූපණය කරයි. සමාජය පිළිබඳ අවබෝධයක් නොමැති පිරිසක් ද සිටින බව "ඒ අම්මණ්ඩිට වැඩි අවබෝධයක් තිබුණේ නැහැ" (2013: 9) යන පෙර පාසල් ගුරුවරිය පිළිබඳ සේනගේ අදහස නාලිනී සහ පෙරපාසල් ගුරුවරිය යන චරිත යුගලය මගින් සමකාලීන සමාජයේ ගැහැණියගේ තත්වය තුලනය කර ගැනීමට අවකාශය ලබා දීමකිග

කාන්තාවගේ මෙම පරිණාමය පශ්චාත් නව්‍යවාදයේ දක්වන ආකාරයේ නව සමාජයකට ඔබින ප්‍රතිසංස්කරණයකි. එය ස්වභාවික සිදු නොවූ ඇති කර ගන්නා ලද වෙනසකි (දිසානායක, 2014:14). පශ්චාත් නව්‍යවාදයේ දී අවධානයට ලක් කරන පුද්ගලයාත්, සමාජයත්, ඉතිහාසයත්, දැනුම් නිෂ්පාදනයත් අතර සංකීර්ණ සම්බන්ධයක් අනාවරණය කිරීම යි. මෙය ලාංකේය සමාජය විෂයයෙහි සංකීර්ණ කාරණා මතු කිරීමට සමාජයේ සාමාන්‍ය තත්වයක් මත අමරසේකර ක්‍රියා කරයි.

මෙම නවකතා යුගලයෙහි දැක්වෙන මොරීන් සහ නාලිනී චරිතද්වයය නව සමාජ පරිවර්තනයට අනුව සැකසුණු කාන්තා චරිත වශයෙන් කැපීපෙනෙයි. මල්ලිකා එහි ක්‍රමික විකාශයක නිරත වන්නියකි. සුජාතා, දීපිකා සහ මව ප්‍රධාන ගමනක අග නවකතාවේ චරිත සාම්ප්‍රදායික ගැහැණිය, වස්තු-රූප-ආභරණ ආදියට ලොල් වූ ළාමක ගැහැණියකගේ ආකෘතිය නිරූපණය කරයි. පුරුෂයා සමඟ බුද්ධිමය සහ ක්‍රියාකාරී චරිත ක්‍රමික ව සමාජයේ ගොඩනැගෙන බව ගමනක අගට පසු ව ලියවුණු මහගෙදර නවකතාවෙන් නිරූපණය කරයි. සමස්ත කාන්තා චරිත හෝ සමස්ත සමාජය මෙම නවකතා යුගලයෙන් අනාවරණය නො වන අතර සමාජ පරිවර්තන වෙත සීඝ්‍රයෙන් ලක් වන මධ්‍යම පාංතික චරිත කිහිපයක් නිරූපණය කරන්නකි. කතුවරයාගේ මෙම කෘතිවල මුඛ්‍ය අරමුණ සමකාලීන දේශපාලන තත්ව නිරූපණය වුව ද, එම සංසිද්ධි අතර වර්තමාන කාන්තාව දැනුම, බුද්ධිය, ආකල්ප සහ චර්යාත්මක වශයෙන් ද සන්නද්ධ වෙමින් සිටින බව සන්නිවේදනය කරයි.

**නිගමනය**

ගුණදාස අමරසේකර ස්වකීය නවකතාවල දක්වන පශ්චාත් නූතනවාදී සමාජය සහ එහි ක්‍රමික විකාශය කාන්තාව කෙරෙහි ඇයගේ තීරණ ගැනීම, නායකත්වය, ස්වාධීනත්වය, අධ්‍යාපනය, සමාජ සවිඥානිකත්වය වැනි විවිධ ක්ෂේත්‍ර ඇසුරින් විග්‍රහ කරයි. සමාජ, දේශපාලන යුග විකාශයක් සහිත ගමනක අග මෙන් ම බටහිර අධ්‍යාපනයේ බලපෑම විග්‍රහ කරන මහගෙදර නවකතා යුගලයෙන්ම නව ප්‍රවණතා සමග ක්ෂණික ව සංකලනය වන මධ්‍යම පාංතික කාන්තා භූමිකා විග්‍රහයට ලක් වී ඇත. ඉදිරිගාමී ප්‍රවණතා සහිත කාන්තාව සාම්ප්‍රදායික ගෘහණිය භූමිකාව සහ එහි රුචිකත්ව ඉක්මවා සමාජීය කර්තව්‍ය වෙත යොමු වන ආකාරය අවධානයට ලක් වෙයි. අමරසේකරගේ මුඛ්‍ය අරමුණ කාන්තාව නිරූපණය හෝ ඇයගේ භූමිකාවේ වර්ධනය ප්‍රකාශ කිරීම නොවේ. එහෙත් එහි අංශයක් වශයෙන් කාන්තාව අනායාසයෙන් සම්බන්ධ වී ඇති ආකාරය පුළුල් අර්ථකථනයකට අවකාශයකි.

**මුඛ්‍ය පදඃ** කාන්තාව, කාන්තාවගේ නායකත්වය, පශ්චාත් නූතනවාදය, මැදිහත් වීම, සවිඥානිකත්වය

**ආශ්‍රිත ග්‍රන්ථ**

අමරසේකර, ගුණදාස. (2011). *ගමනක අග*. නුගේගොඩඃ විසිදුනු ප්‍රකාශකයෝ.

අමරසේකර, ගුණදාස. (2013), *මහගෙදර*. නුගේගොඩඃ විසිදුනු ප්‍රකාශකයෝ.

ගම්ලත්, සුචරිත. (2022). *සාහිත්‍ය ප්‍රවේශය*. කොළඹඃ සේරි ප්‍රකාශන.

දිසානායක, විමල්. (2014). *පශ්චාත් නව්‍යවාදය හැඳින්වීමක්*. බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ.

Dissanayaka, Wimal.(2009). *Sinhala Novel and the Public Sphere*.

Tong, R. (1989). *Feminist thought: A Comparative Introduction*, Mestivew Press Inc.